**ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 238 - රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2. 1 ආදායම් කළමනාකරණය

#### 2.1.1 හිඟ ආදායම් අය කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මු.රෙ. 128 (2) (ඉ) ප්‍රකාරව රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව එකතුකර ගැනීම සම්බන්ධව රාජ්‍ය ආදායම් පිළිබඳ ගණන්දීමේ නිලධාරියෙකු වගකීමට බැඳේ. ඒ අනුව, 2022 වර්ෂයේ ආරම්භක දිනට වූ හිඟ සමාජ වගකීම් බද්ද ලෙස රු. 63,143,287 ක් සහ 2022 වර්ෂයේදී හඳුනාගත් පෙර වර්ෂයන්ට අදාළ හිඟ මුදල වූ රු.525,089ක් ඇතුළුව 2022 දෙසැම්බර් 31 දිනට එකතුව රු.63,527,426 ක ලැබිය යුතු හිඟ බදු මුදල් අය කරගෙන නොතිබුණි. | මෙහි සඳහන් හිඟ ආදායම් බදු මුදල් කඩිනමින් අයකර ගන්නා ලෙස අදාළ ආයතන වෙත දන්වා යවා ඇති අතර අයකර ගත නොහැකි හිඟ බදු ආදායම් අදාළ නීතිමය ප්‍රතිපාදනයන්ට යටත්ව කපා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස දේශිය ආදායම් දෙපාර්තමේන්තුව හා රේගු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | හිඟ ආදායම් අප්‍රමාදව එකතු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් හතරක් සඳහා මු.රෙ.66 මාරු කිරීම් මඟින් එකතුව රු.3,335,000 ක් එනම් මුල් ඇස්තමේන්තුවෙන් සියයට 28 සිට 44 දක්වා වූ පරාසයකින් ප්‍රතිපාදන වැඩිකර තිබුණි. | කාර්යාලයීය උපකරණ, ඉන්ධන සහ ආහාර පාන වල මිල ගණන් පැවති උද්ධමන තත්ත්වය මත ඉතා විශාල ලෙස ඉහළ යාම, දුරකථන බිල්පත් හා අන්තර්ජාල බිල්පත් වැරදීමකින් රු.500,331.46 ක් ලෙස යොමු කිරීම හේතුවෙන් අනුමත කළ ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ.66 මඟින් අමතර ප්‍රතිපාදන වෙන්කරගන්නා ලදී. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |
| (ආ) | 238-1-1-1303 වැය විෂයය සඳහා වූ රු.500,000 මූලික ඇස්තමේන්තුවට අමතරව මු.රෙ.66 මගින් රු.634,000ක් මාරු කරගෙන තිබුණු අතර, එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 127ක වැඩිවීමක් විය. | ප්‍රතිපාදන අනුමත කිරීමේදී ඉල්ලුම් කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් අනුමත කර ඇති බැවින් සහ ලේඛනාගාරයේ අලුත්වැඩියා කටයුතු එම වර්ෂය තුළ දී සිදු කිරීම සඳහා ද අමතර වියදමක් දැරීමට සිදු වූ නිසා මු.රෙ. 66 මඟින් අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සිදු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |
| (ඇ) | වැය විෂයයන් හතරක එකතුව වූ රු.6,490,000ක ප්‍රතිපාදන මුදලක් මු.රෙ.66 මාරු කිරීම් මඟින් අඩුකර තිබුණ අතර, එය මූලික ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 33 සිට 73 දක්වා වූ පරාසයක විය. | අවශ්‍ය ප්‍රමාණයට වඩා ප්‍රතිපාදන ලබා දීම, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කටයුතු අපේක්ෂිත ආකාරයෙන් සිදු නොවීම, වාහන වෙනුවෙන් කල්බදු කුලී ගෙවීම් හී ගිවිසුම් කාලය කල්පිරීම හේතුවෙන් ගෙවීම් සිදු නොකිරීම හා අයවැය වාර්තා මුද්‍රණය, මුදල් අමාත්‍යාංශය විසින් අභ්‍යන්තරිකව සිදු කිරීමට තීරණය කර තිබූ බැවින් සහ අනිකුත් වාර්තා මුද්‍රණය කිරීම සීමා වූ නිසා ඉතිරි ප්‍රතිපාදන කාර්යක්ෂමව කළමනාකරණය කරගැනීම පිණිස මු.රෙ. 66 යටතේ මාරු කිරීමට සිදු විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | වැය විෂයයන් දෙකකට අදාළව මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව දක්වා මු.රෙ.66 යටතේ එකතුව රු.2,600,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද, එම වැය විෂයයන්ගේ එකතුව රු.2,221,191 ක ඉතිරිවීම් පැවතුණි. | වියදම් සීමා කිරීම, දුරකථන බිල්පත් හා අන්තර්ජාල බිල්පත වැරදීමකින් යොමු කිරීම හේතුවෙන් අනුමත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා මු.රෙ.66 මඟින් අමතර ප්‍රතිපාදන වෙන්කරගන්නා ලදී. නමුත් එම බිල් පත නැවත නිවැරදි කිරීම නිසා ප්‍රතිපාදන ඉතිරි වීම, ඉන්ධන මිල ගණන් ඉහළ යාම නිසා මු.රෙ.66 මඟින් අමතර ප්‍රතිපාදන වෙන්කර ගන්නා ලද අතර, ඊට අමතරවද ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් මෙම වැය විෂය සඳහා අමතර ප්‍රතිපාදන වෙන්කර ඇත. මෙම හේතූන් මත ඉහත වැය විෂයන් හී ප්‍රතිපාදන ඉතිරි වීම් සිදු වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්ත්විකව කළ යුතු වීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 104 හා 110 | දෙපාර්තමේන්තුව සතු වාහනයකට අනතුරකින් සිදු වී තිබුණු හානිය සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් හා පූර්ණ වාර්තාවක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණු අතර, අලාභහානි ලේඛනයේද එම අලාභය සටහන් කර නොතිබුණි. | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති නිරීක්ෂණයන් හා එකඟ වේ. | වාහන අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 හි 03(ආ) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ සිදු කළ යුතු ක්‍රියාකාරකම් (Activities) කාල රාමුවක් සහ එම ක්‍රියාකාරකම්වලට අදාළව අවසන් ප්‍රතිඵල (Outcome/ Output) සඳහන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ කාර්යසාධක දර්ශක, හඳුනාගත හැකි ක්‍රියාකාරකම්වලට අදාළ ප්‍රගතිය පිළිබඳ පරීක්ෂා කිරීමට හැකිවන අයුරින් සංඛ්‍යාත්මක වශයෙන් ප්‍රමාණවත් පරිදි තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරකම් සඳහා සංඛ්‍යාත්මක කාර්යයසාධක අගයන් ඇතුළත් කර නොමැති අතර ඉදිරි වර්ෂ වල දී සකස් කිරීමට නියමිත වාර්ෂික ක්‍රියාකාරි සැළසුම් වල හඳුනාගැනීමට හැකියාවක් ඇති ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත කාර්යසාධක දර්ශකයක් හඳුනාගෙන ඊට සංඛ්‍යාත්මකව තොරතුරු ඇතුළත් කිරීමට කටයුතු කිරීම සඳහා සටහන් කරගන්නා ලදී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරිපත් කරන ලද සැලැස්මට අනුගතව ප්‍රගතිය පරීක්ෂා කිරීමට හැකි වන පරිදි ප්‍රමාණවත් තොරතුරු ඉදිරිපත් කළ යුතු වීම. |

#### 3.1.2. කාර්යභාරයන් ඉටු කිරිම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අපේක්ෂිත සමාජ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශය ඇතුළු අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර රජයේ පුළුල් සංවර්ධන රාමුව තුළ මූල්‍ය ප්‍රතිපත්ති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම ලෙස හඳුනාගෙන තිබුණු අතර, දේශීය හා ගෝලීය සාර්ව ආර්ථික සංවර්ධනය විශ්ලේෂණය කිරීමේ ක්ෂේත්‍ර ආවරණය කරමින් රටේ බදු ප්‍රතිපත්තිය සඳහා දෙපාර්තමේන්තුව වගකිව යුතු බව හඳුනාගෙන තිබුණි.<br><br>2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත මඟින් රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් පාලනය මූලිකව සිදු කරනු ලබන අතර, මෙම පනතේ පරමාර්ථ ඉටු කර ගැනීම සම්බන්ධව 2019 සිට 2022 වර්ෂය දක්වා ආණ්ඩුවේ ක්‍රමෝපායන් ක්‍රියාවට නැංවීම පිළිබඳ දර්ශක 2 ක ප්‍රගතිය පහත පරිදි විය. | | |

| විස්තරය | වර්ෂය | | | |
|---|---|---|---|---|
| | **2019** | **2020** | **2021** | **2022** |
| ………… | ……. | ……. | ……. | ……. |
| අයවැය පරතරය - දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට | 9.6 | 11.1 | 11.7 | 10.2 |
| රාජ්‍ය ණය - දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට | 81.9 | 96.5 | 100.1 | 113.8 |

ඉහත කරුණු පිළිබඳව පහත නිරීක්ෂණයන් කෙරේ.

| | | | |
|---|---|---|---|
| (අ) | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව අයවැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට පහක් නොඉක්මවන බවට වගබලා ගත යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂය වන විට එය සියයට 10.2 ක් වී තිබුණි. | විගණන විමසුම මඟින් පෙන්වා දී ඇති පරිදි 2003 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව අයවැය පරතරය දළ දේශීය නිෂ්පාදිතයෙන් 5% ක් නොඉක්මවන බවට වගබලාගත යුතු බව සඳහන් කර ඇතත් 2022 වර්ෂයේ දී එම ප්‍රමාණය 10% ඉක්මවා ඇති බව නිරීක්ෂණ කර තිබේ. එම විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ. | පනතේ දක්වා ඇති ආකාරයට අයවැය පරතරය පවත්වා ගැනීමට වගබලා ගත යුතු වීම. |
| (ආ) | 2013 සංශෝධිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව ආණ්ඩුවේ මුළු බැරකම් ඒ මුදල් වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට හැටක් නොඉක්මවන බවට සහතික විය යුතු බව දක්වා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී එය සියයට 113.8 ක් වී තිබුණි. | රාජ්‍ය ණය එනම්, රජයේ මුළු බැරකම් ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 113% සීමාව ඉක්මවා ගොස් ඇති අතර, මේ සඳහා ණය පොලී අනුපාතිකයන් හී සිදුවී ඇති වෙනස්කම්, විදේශ විනිමය අනුපාතය විශාල ලෙස වෙනස් වීම නිසා ශ්‍රී ලංකා රුපියලෙහි අගය 2022 වර්ෂයේ විශාල ලෙස පිරිහීමට ලක් වීම, ශ්‍රී ලංකා ආර්ථිකයට එල්ල වූ දැඩි බලපෑම නිසා ආර්ථික වර්ධනය 7.8 කින් සංකෝචනය වීම නිසා දළ දේශිය නිෂ්පාදනය ඉතා පහළ තත්ත්වයකට ඇද වැටීම සහ 2022 වර්ෂයේ විදේශ ද්විපාර්ශවීය ණය ආපසු ගෙවීම නතර කිරිම හේතුවෙන් සමස්ත විදේශ ණය ප්‍රමාණය අඩු නොවීම යනාදී හේතු නිසා 2022 වර්ෂයේ රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස ඉතා ඉහළ අගයක් ගෙන ඇත. | පනතේ දක්වා ඇති ආකාරයට බැරකම් සීමාව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

කෙසේ වෙතත්, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) පනත හා ඊට කරන ලද එනම්, සංශෝධන 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත, 2016 අංක 13 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත සහ 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) (සංශෝධන) පනත් මඟින් මුළු රාජ්‍ය ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට 60 සීමාවට ළඟා වීම වසර 2030 වන විට විය යුතු යැයි නියම කර ඇත.

### 3.1.3 ණය කළමනාකරණ නියෝජිත ආයතනයක් ස්ථාපිත කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ණය කළමනාකරණය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමට රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිතායතනයක් (PDMA) ස්ථාපිත කිරීම පිළිබඳ 2022 රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සඳහන් වුවද, මෙම ආයතනය පිහිටුවීම, ක්‍රියාකාරීත්වය සහ එහි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි. | රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිත ආයතනයක් (PDMA) ස්ථාපිත කිරීම සඳහා ඊට අදාළ මූලික කටයුතු දැනට කරගෙන යනු ලැබේ. මේ හා සම්බන්ධ න්‍යායාත්මක සහ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් සකාච්ඡා කිරීමට ජත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුවේ නියෝජිතයන්ගෙන් සමන්විත ඒකාබද්ධ දූත මණ්ඩලයක් ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය සහ සෙසු ආයතන වල පාර්ශව කරුවන් සමඟ සකාච්ඡා වට ගණනාවක් පවත්වන ලදී. ඉන් අනතුරුව මෙම දූත මණ්ඩලය මඟින් කෙටුම්පත් කරන වාර්තාව අදාළ ආයතන වල නිරීක්ෂණ ඉදිරිපත් කිරිම සඳහා යොමු කර ඇත. එමෙන්ම මෙහි ඉදිරි කටයුතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව මූලිකව සිදු කරනු ලබන බවත් දක්වා ඇත. | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන පරිදි නියෝජිතායතනය ස්ථාපිත කිරීම හා එහි ප්‍රගතිය වාර්තා කළ යුතු වීම. |

## 3.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආදායම් රැස් කිරීම සම්බන්ධ අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 4(ආ) සහ මු.රෙ. 128(ඉ) ප්‍රකාරව හිඟ ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් කඩිනම් පියවර ගත යුතු බවත්, තවද 2022 ක්‍රියාකාරී සැලැස්මේ කාර්ය සාධක දර්ශක 06 හි (iv) වන උපදර්ශකයේ සඳහන් ආකාරයට බදු පැහැර හැරීම් අවම කිරීම සඳහා නොගෙවූ බදු විශ්ලේෂණය කිරීම සහ ඒ සඳහා ප්‍රතිපත්ති නිර්දේශ සකස් කිරීම සඳහන් කර තිබුණ ද, විගණනයට අනාවරණය වූ තොරතුරු අනුව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් 2022 දෙසැම්බර් 31 වන විට රැස් කළ යුතු හිඟ ආදායම (බදු ආදායම සහ බදු නොවන ආදායම) රු. 843,975,852,935 ක් වැනි ඉහළ අගයක් දක්වා වර්ධනය වී තිබුණි. | මෙහි වැඩි ප්‍රතිශතයක් හිඟ බදු අයකර ගැනීම හා බදු ගණනය කර ඇති ආකාරය සම්බන්ධයෙන් නඩු කටයුතු පවතින අතර එම නඩු අවසන් වන තුරු අදාළ හිඟ බදු මුදල් සම්බන්ධයෙන් ක්‍රියාකිරිමට නොහැකි වී ඇත.<br><br>එසේම, අනෙකුත් අයකර ගත හැකි හිඟ ආදායම් අයකරගන්නා ලෙස අදාළ ආදායම් ගණන්දීමේ නිලධාරීන්ට වරින් වර දැනුවත් කර ඇති අතර, මුදල් අමාත්‍යාංශයේ පවතින මාසික මුදල් ප්‍රවාහ කළමනාකරණ රැස්වීම් (Cash Flow Management Meeting) වල දී ද වගකිව යුතු නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ. එමෙන්ම හිඟ බදු අයකර ගැනීමට මෙතෙක් ගත වී ඇති කාලය (Age analysis) හිඟ බදු අංශ, සත්‍යවශයෙන්ම අය කර ගත හැකි හිඟ බදු කොපමණද, හිඟ බදු සම්බන්ධයෙන් පවතින නඩු කඩිනමින් විසඳීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ද යෝජනා කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සෑම අවස්ථාවකදීම කටයුතු කරන ලෙස යෝජනා කර ඇති අතර ඒ පිළිබඳ නිරන්තර පසුවිපරම් කටයුතු සිදු කරනු ලබයි. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතු වීම. |

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දින වන විට අනුමත කාර්ය මණ්ඩලය 61 ක් වු අතර, එයින් තනතුරු 17 ක් පුරප්පාඩු වී පැවතුණි. එයින් තනතුරු 09 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. 2023 මාර්තු 31 දින වන විට පුරප්පාඩුව පැවති ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 03 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 01 ක් සඳහා නිලධාරීන් 04 දෙනෙකු සේවයට අනුයුක්ත කර තිබුණු අතර, තවදුරටත් දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 13 ක් විය. | මෙම සියළු පුරප්පාඩු සම්පූර්ණ කර දෙන ලෙස අවස්ථා ගණනාවකදීම මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීම හෝ අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතු වීම. |